# නංගීගේ පූංචි බෝනික්කා



කවිනුලී බංඩාර

ග්‍රන්ථ නාමය :- නංගිගේ පුංචි බෝනික්කා

කථාව පිටකවරය හා චිත්‍ර :- කවිනුලී බංඩාර

මෙම කෘතියෙහි සියලුම අයිතිය කතෘ සතුය...

කතෘගේ වෙනත් කෘති : *පුංචි සුරංගනාවී

*මගේ දඟකාර චූටි නංගියා

ප්‍රකාශය හා පළමු මුද්‍රණය : 2025 පෙබරවාරි 08

ISBN අංකය :- 978-624-208-366-7

# <u>පිදුම</u>

**මගේ පවුලේ සැමට , පුංචි යහළුවන්ට සහ පාසලට**

**කවිනුලී බංඩාර**
**5 ශ්‍රේණිය B**
**මහාමායා බාලිකා විදුහල ,**
**මහනුවර.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඥන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මගේ නංගිගේ හතරවෙනි උපන් දිනයට අම්මා ලස්සන බෝනික්කෙක් ගෙනල්ලා දුන්නා. එයාගේ කොණ්ඩේ කහ පාටයි. ඇස් දෙක ළා නිල් පාටයි. රතු ලස්සන ගවුමක් අන්දලා තිබුණේ. අපේ නංගි එයාට කතා කරේ චූටි කියලා.



නංගි කොයිවෙලාවේවත් චූටිව බිමින් තිබ්බේත් නෑ. නිදාගත්තේත් එයාව තුරුල් කරගෙන. නංගි චූටිට එයා කන බත් එකෙනුත් කවනවා. නංගිට චූටි හරියට මනුස්ස යාළුවෙක් වගේ.



නංගි නැති දවසක අයියා සෙල්ලමට චූටිව හැංගුවා.



ටික වේලාවකට පස්සේ නංගි ගෙදර ආවා.

නංගි ඇවිල්ලා බලනකොට චූටි හිටියේ නැති නිසා නංගි  හොඳටම බය වුණා. ඇස්වල කඳුළු පිරුණා.



නංගි අඬ අඬා චූටිව හෙව්වා. ඒත් එයා හිටියේ නෑ. නංගි බිම වාඩිවෙලා කෑ ගහ ගහා පෙරළී පෙරළී අඬන්න ගත්තා.



මේක බලන් හිටපු මට හොඳටම දුක හිතුණා.



මාත් ගිහින් චූටිව හොයන්න ගත්තා. එයා හිටියේ නෑ....

මම ඒක අම්මාට කීවා. අම්මා අයියව ගෙන්නගෙන මේ ගැන ඇහුවා. ගහන්නත් හැදුවා.



අයියා බෝනික්කාව හැංගුව තැනින් ගෙනල්ලා දුන්නා. “ආයේ එහෙම කරන්න එපා..” කියලා, අම්මා අයියාට තරවටු කළා.

නංගි තාම අඬනවා. මං දුවගෙන ගිහිං නංගිගේ අතේ බෝනික්කාව තිබ්බා.



එයා චූටි දිහා බලලා, කඳුළු පිහදාගෙන ලස්සනට හිනාවුණා. අයියත් ඒක බලා ඉඳලා හිනාවුණා.

නංගිගේ ලස්සන හිනාව මට කවදාවත් අමතක වෙන්නේ නෑ....



නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්